ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තුමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2015/2016

**LWU4323 - කම්කරු නීතිය**

කාලය - පැය එකයි

---

දිනය: 2016 නොවැම්බර් 02 වන දින | වේලාව: පෙ.ව 9.00 - පෙ.ව 10.00 දක්වා

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. මෝටර් රථ වාහන තක්සේරුකරුවකු වන ශෙහාන්, ජන සෙත රක්ෂණ (පුද්ගලික) සමාගමට අනුබද්ධව කටයුතු කරයි. ඔහු දිනපතා කාර්යාලයට පැමිණීම අවශ්‍ය නොවන නමුත් කෙටි දැනුම් දීමකින් රාජකාරි කාර්යයන් ලබා ගැනීම සඳහා සූදානම් වී සිටීම ඔහුගෙන් අපේක්ෂා කෙරේ. ඔහු විසින් රක්ෂණ හිමිකම් සම්බන්ධව වාහනවලට සිදුව ඇති අලාභ තක්සේරු කර එම වාහන පරීක්ෂාවෙන් දින තුනක් ඇතුළත සමාගමේ මෝටර් රථ හිමිකම් දෙපාර්තුමේන්තුවට වාර්තා සැපයිය යුතුය. සෑම වාර්තාවක් සඳහාම ඔහු වෙත ස්ථාවර දීමනාවක් ගෙවනු ලැබෙයි. අවශ්‍යතාව අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පරීක්ෂාවන් සඳහා ඔහු සහභාගි විය යුතුය. ගමනාගමනය සඳහා ශෙහාන් තමන්ගේම මෝටර් බයිසිකලය යොදා ගන්නා අතර ඒ සඳහා සමාගම කිසිදු ප්‍රවාහන දීමනාවක් නොගෙවයි. කෙසේ වෙතත් ශෙහාන්ට තමා වෙත පැවරුණු තක්සේරු කාර්යයන් වෙනත් අයෙකුට පවරා දිය නොහැකි අතර සමාගමේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් කිසිදු පුද්ගලයකු වෙනුවෙන් කිසිදු කාර්යයක් බාර ගැනීමටද නොහැක.

   සමාගම තුළ වූ මූල්‍ය අර්බුදයක් හේතුවෙන් ජන සෙත රක්ෂණ සමාගමේ කළමනාකාරිත්වය ශෙහාන් සමග වූ ගිවිසුම අවසන් කිරීමට අදහස් කර ඇත. ශෙහාන් සමාගමෙන් වන්දි අපේක්ෂා කරයි. කෙසේ වෙතත් කළමනාකාරිත්වය ශෙහාන් සමාගමේ සේවකයකු ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කරයි. තමා ජන සෙත රක්ෂණ සමාගමේ සේවකයෙකුද යන්න සම්බන්ධයෙන් ශෙහාන් ඔබගේ උපදෙස් විමසා සිටී.

   අදාළ පරීක්ෂණ හා නඩු තීන්දු නීතිය ඇසුරින් ශෙහාන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

2. (අ) රසික 2016 ජනවාරි 1 වන දින සිට නිල්වලා මූල්‍ය (පුද්ගලික) සමාගමේ සහකාර කළමනාකරුවකු ලෙස සේවය කළේය. ඔහුගේ පත්වීම වසරක පරිවාස කාලයකට යටත් කර තිබිණි. කෙසේ වෙතත් රාජකාරිමය කරුණක් සම්බන්ධයෙන් රසික සහ කළමනාකාරීත්වය අතර ඇතිවූ මත ගැටුමකට පසුව 2016 ඔක්තෝම්බර් 6 වන දින කළමනාකාරීත්වය විසින් රසිකගේ සේවය අවසන් කරන ලදී. කළමනාකාරීත්වය ප්‍රකාශ කර සිටියේ පරිවාසිකයකු ලෙස රසිකගේ හැසිරීම සමාගමට පිළිගත නොහැකි බවයි.

තමන් වාද කළේ ව්‍යාපාරයේ යහපත වෙනුවෙන් බව රසික පවසා සිටී. තම සේවය අවසන් කිරීමට එරෙහිව සහන ඉල්ලා සිටීමට ඔහු අපේක්ෂා කරයි.

අදාළ නඩු තීන්දු නීතිය ඇසුරින් රසිකට උපදෙස් දෙන්න.

(ලකුණු 12)

(ආ) "පරිවාසිකයෙකු ලෙස පත් වූ තැනැත්තෙකුට පරිවාස කාලය ඉකුත් වීමේදී නිරායාසයෙන්ම සේවයේ ස්ථිර වීමක් ඉල්ලා සිටිය නොහැක."

සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

*හිමිකම් ඇවිරිණි*

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES

DEPARTMENT OF LEGAL STUDIES

LL.B DEGREE PROGRAMME - LEVEL 6

CONTINUOUS ASSESSMENT TEST 1 - 2015/2016

LWU4323 - LABOUR LAW

DURATION- 01 HOUR

---

**DATE : 2nd November 2016** **TIME: 9.00 a.m - 10.00a.m**

---

**Answer one (01) question only.**

**Candidates will be penalized for illegible handwriting.**

1. Shehan is a motor car assessor, and he is attached to 'Jana Setha' Insurance Pvt. Ltd. He is not required to come to the office daily, but he is expected to be available to receive his work assignments at short notice. He is required to assess the damages of the vehicles with regard to insurance claims and submit reports to the Motor Claims Department of the Company within three days of the examination of the vehicles. He is paid a fixed amount for submission of each report. He should attend for the assessments in any part of the country as required. Shehan uses his own motor bicycle for travelling, and the Company does not pay any travelling allowance. However, Shehan cannot delegate the assessments assigned to him to anyone else. Shehan cannot undertake any work for any other person without prior permission of the Company.

   Due to a financial problems in the Company, the Management of Jana Setha Insurance intends to terminate the agreement with Shehan. Shehan expects compensation from the Company. However, the Management refuses to accept Shehan as a workman of the Company. Shehan seeks your advice as to whether he is a workman of Jana Setha Insurance.

   Advise Shehan with reference to relevant tests and case law.

**(20 marks)**

2. (a) . Rasika worked as an Assistant Manager of the Nilwala Finance Ltd since 1st January 2016. His appointment was subjected to a probationary period of one year. However, after an argument between the Management and Rasika relating to an official matter, the Management terminated Rasika's services on 6th October 2016. The Management stated that the conduct of Rasika being a probationer was not acceptable to the Company.

Rasika states that he had the argument in the interests of the business. He wishes to claim relief against termination of his services.

Advise Rasika with reference to relevant case law.

**(12 marks)**

(b) "A person appointed as a probationer cannot claim automatic confirmation on the expiry of the period of probation"

Discuss. **(8 marks)**

*-Copyright reserved-*